**යාපනය විශ්වවිද්‍යාලය - 2020**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------**

යාපනය විශ්වවිද්‍යාලයේ ("විශ්වවිද්‍යාලය") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම පිළිබඳ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (i) | ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) ව්‍යාපෘතිය සහ උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය කඩිනම් කිරීමේ (AHEAD)ලෝක බැංකු **ව්‍යාපෘතිය** මගින් 2020 වසරේ දී රු. මිලියන 385,063,178 ක් වටිනා ජංගම නොවන වත්කම් පරිත්‍යාග කර ඇති අතර 2018 වසරේ දී රු. මිලියන 415,423,614 ක් වටිනා ජංගම නොවන වත්කම් පරිත්‍යාග කර තිබුණි. එම මුදල් අදාළ වර්ෂවල දී ගිණුම්ගත කර නොතිබුණි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය (SLPSAS) 11 අනුව, වත්කම්වල සාධාරණ වටිනාකම අදාළ වර්ෂවල මූල්‍ය ප්‍රකාශනවල වත්කම් සහ ආදායම් ලෙස හඳුනාගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ජංගම නොවන වත්කම් රු. 385,063,178 ක් අඩුවෙන් දක්වා තිබුණු අතර සමුච්චිත හිඟය රු. 120,026,945 ක් වැඩියෙන් දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා හිඟය මූල්‍ය ප්‍රකාශනවල රු.680,459,847 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ජයිකා ව්‍යාපෘතියේ ගෘහභාණ්ඩ සහ උපකරණ 2019 වසරේ දී කෘෂිකර්ම විද්‍යා පීඨයට ලබාදී තිබුණ ද, මෙම වත්කම් පරිත්‍යාගයක් ලෙස සලකා 2021 වසරේ දී මෙම වත්කම් ඉන්වෙන්ටරිගත කිරීමට සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. AHEAD ක්‍රියාකාරකම් විශ්වවිද්‍යාලය හා සම්බන්ධ නොවන වෙනම මෙහෙයුම් වීම. AHEAD ව්‍යාපෘතිය යටතේ ලැබුණු ස්ථාවර වත්කම් පරිත්‍යාග ලෙස සලකා, ඒ අනුව නිසි ලෙස ඇතුළත් කිරීමට කටයුතු කර ඇත. සියලුම විශ්වවිද්‍යාල AHEAD පරිත්‍යාග සම්බන්ධයෙන් ඉහත ක්‍රියාපටිපාටියම අනුගමනය කරයි. | වත්කම් සහ ආදායම් අදාළ වර්ෂවලදී හඳුනාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | රු. 31,189,895 ක් වන ප්‍රාග්ධන පරිත්‍යාග SLPSAS 11 අනුව, ආදායම ලෙස හඳුනා නොගෙන ජංගම නොවන වගකීම් යටතේ සීමා කරන ලද අරමුදල් ගිණුමට ඇතුළත් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වසර සඳහා හිඟය සහ ජංගම නොවන වගකීම් මූල්‍ය ප්‍රකාශනවල එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | SLPSAS 10 අනුව, පරිත්‍යාගයක් ලෙස පිළිගත් විනිමය නොවන ගනුදෙනුව ආදායම ලෙස පිළිගත යුතුය. අපට ස්ථාවර වත්කම් පරිත්‍යාගයක් ලෙස ලැබෙන විට මෙම පරිත්‍යාගය සඳහා මුදල් ගලා ඒමක් සිදු නොවේ. SLPSAS 10 අනුව, පරිත්‍යාග ආදායම ලෙස වර්ගීකරණය කළ යුතුය. ඒ අනුව, විවිධ පරිත්‍යාගශීලීන් යටතේ ලැබෙන ස්ථාවර වත්කම් ඉදිරියේදී ආදායම ලෙස සටහන් කිරීමට කටයුතු කර ඇත. | සියලුම අයිතම යෝග්‍ය පරිදි වර්ගීකරණය කළ යුතුය. |
| (iii) | 2015 වසරේ අමාත්‍යාංශ 3 කින් ලැබුණු ඉඩම් සහ ගොඩනැගිලි සහ වාහන දෙක විශ්වවිද්‍යාලය මගින් පරිහරණය කර තිබුණද, මෙම වත්කම් ගිණුම්ගත කිරීමට හා ඒවායේ හිමිකම පවරා ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම වත්කම් හැකි ඉක්මනින් යාපනය විශ්වවිද්‍යාලයට පවරා ගැනීම සඳහා පසු විපරම් කටයුතු සිදුවෙමින් පවතී. | දේපළ අයිතිය පවරා ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (iv) | පශු සම්පත් තක්සේරු කර ගිණුම්ගත කිරීම සිදු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේ එම පශු සම්පත්වල ඇස්තමේන්තුගත වටිනාකම දළ වශයෙන් රු. 3,089,400 ක් විය. | විශ්වවිද්‍යාලය සතු ගොවිපළ, බෝග, ගොවිපළ පශු සම්පත් හා කුකුළු ගොවිපළ ඉදිරියේදී විශ්වවිද්‍යාලයීය ගිණුම් පොත්වල ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. | සියලුම වත්කම් හඳුනාගෙන අදාළ වර්ෂවල දී ගිණුම්ගත කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු දෑ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජංගම වගකීම් යටතේ ස්වයං මූල්‍යකරණ පාඨමාලා සඳහා ගෙවිය යුතු මුදල් ලෙස පෙන්වා දී ඇති රු. 6,249,270 ක සමාහරණය වෙමින් පවත්නා මුදල වසර 3 සිට 19 දක්වා කාලසීමාවක් නිරවුල් නොවී පැවතුණි. | මෙම අරමුදල් භාවිතා කරන අවස්ථාවලදී, ලබා දී ඇති නිර්ණායක සපුරා ඇති බවටත්, අරමුදල් නිසි ලෙස භාවිතා කර ඇති බවටත් අපි සහතික කරන්නෙමු. එසේම මෙම පාඨමාලා සඳහා භාවිත නොකළ අරමුදල් සඳහා හිමිකම් පෑමට ඕනෑම අවස්ථාවක පරිත්‍යාගශීලියාට හැකි වේ. එම නිසා, මෙම අරමුදල් ඉල්ලුම මත ගෙවිය යුතු බැවින් ජංගම වගකීම් යටතේ තබා ගැනීමට සිදු විය. | නිරවුල් නොකළ ශේෂ උපයෝජනය කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල ආයතන සංග්‍රහය** | | | |
| (i) XXII පරිච්ඡේද යේ 2 සහ 2.9 වගන්ති | 2013 ඔක්තෝම්බර් 01 වැනි දින සහකාර කථිකාචාර්යවරයකුගේ වැඩ තහනම් කර එම දින සිට ක්‍රියාත්මක වන පරිදි එම සහකාර කථිකාචාර්යවරයා නැවත සේවයේ පිහිටුවා තිබූ අතර එතැන් සිට මේ දක්වා ඔහුව විශ්වවිද්‍යාලය මගින් අනිවාර්ය නිවාඩු යවා තිබුණි. කෙසේ වෙතත්, ඔහු මහාචාර්යවරයෙකු දක්වා උසස් කර තිබුණු අතර විශ්වවිද්‍යාලයට කිසිදු සේවාවක් ලබා නොගෙන 2013 ඔක්තෝබර් 01 සිට 2021 පෙබරවාරි 28 දක්වා කාලය සඳහා රු. 26,315,186 ක් ගෙවා තිබුණි. | නීතිපති දෙපාර්තමේන්තුව මගින් වාර්තාව 2021.04.29 දින හෝ ඊට පෙර අභියාචනාධිකරණයට ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි විශ්වවිද්‍යාලය විසින් වාර්තාව නීතිපති දෙපාර්තමේන්තුවෙත යැවිය යුතුය. | විශ්වවිද්‍යාලයේ කළමනාකාරීත්වය විසින් ආයතන සංග්‍රහයේ අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ii) XX පරිච්ඡේද යේ 3 කොටස | අදාළ ආයතනයේ සේවයේ නිරතව සිටින සෑම පුද්ගලයකුගේම පැමිණීම සහ පිටවීම සලකුණු කරනු ලබන පැමිණීමේ ලේඛනයක් සෑම උසස් අධ්‍යාපන ආයතනයකම පවත්වා ගෙන යා යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම සහ පිටවීම අත්සන් තැබීම මගින් හෝ ඇඟිලි සලකුණු සුපිරික්සකය මගින් හෝ තහවුරු කර නොගෙන ඔවුන් වෙත වැටුප් වශයෙන් රු.2,148,447,845 ක් ගෙවා තිබුණි. | කෙසේ වෙතත්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඔවුන්ගේ පැමිණීම තහවුරු කරයි. සෑම විටම අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ඔවුන්ව අධීක්ෂණය කරනු ලැබේ. | විශ්වවිද්‍යාල කළමනාකාරීත්වය ආයතන සංග්‍රහයේ අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ | | | |
| (i) 1995 ජූලි 14 දිනැති අංක 636 දරන චක්‍රලේඛය | විභාග ප්‍රතිඵල මාස 3ක් ඇතුළත නිකුත් කළ යුතු වුවද, පීඨ හතක ප්‍රතිඵල මාස 01 සිට මාස 21 දක්වා කාල ප්‍රමාද සහිතව නිකුත් කර තිබුණි. | පසුගිය වසරට සාපේක්ෂව, ප්‍රතිඵල නිකුත් කිරීමේ සැලකිය යුතු දියුණුවක් දක්නට ලැබිණි. මෙම ක්‍රියාවලිය සමීපව නිරීක්ෂණය කිරීමට පියවර ගෙන තිබුණි. ප්‍රතිඵල නිකුත් කිරීමේ කාල නියමය සභාව විසින් අනුමත කළ යුතු විභාග සම්බන්ධ අතුරු නීතියට ඇතුළත් කර ඇත. | විශ්වවිද්‍යාල කළමනාකාරීත්වය චක්‍රලේඛ අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ii) 2010 පෙබරවාරි 05 දිනැති අංක 920 දරන චක්‍රලේඛය | 2014 සිට 2019 දක්වා නිශ්චිත අධ්‍යයන නිවාඩු කාලය තුළ, පශ්චාත් උපාධි හැදෑරීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 07 දෙනෙකු සඳහා විශ්වවිද්‍යාලය මගින් රු.17,027,348 ක් වැය කර තිබුණි. ඔවුන් සිය උපාධිය සම්පූර්ණ නොකර නැවත රාජකාරි ආරම්භ කර තිබුණද, එම වියදම් අය කර ගැනීමට විශ්වවිද්‍යාලය නිසි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අධ්‍යයනය අවසන් කර වාර්තාව ලැබුණු වහාම මෙම ගැටලුව විසඳීමට කටයුතු කරනු ලැබේ. | විශ්වවිද්‍යාල කළමනාකාරීත්වය චක්‍රලේඛ අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

--------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතුවලින් රු. 966,484,640 ක හිඟයක් ඇති වූ අතර, පූර්ව වර්ෂයේ අනුරූප හිඟය රු. 1,236,122,034 ක් විය. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.269,637,394 ක වර්ධනයක් නිරීක්ෂණය විය. එම වර්ධනයට ප්‍රධාන හේතුව වූයේ සමාලෝචිත වර්ෂයේ දී පුනරාවර්තන ප්‍රදානය රු. 203,512,000 කින් වැඩි වීමයි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ කාර්යසාධනය පහත පරිදි වේ.

#### 3.1.1 පුස්තකාල පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 සිට 2018 දක්වා කාලය තුළ වැය කරන ලද රු. 1,177,344 ක් සඳහා එම වටිනාකමට අදාළ පොත් සහ වාර සඟරා මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වාම විශ්වවිද්‍යාලයට ලැබී නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, විශ්වවිද්‍යාල සිසුන්ට ඉහළ මට්ටමේ දැනුම හා කුසලතා ලබා ගැනීමට තිබූ අවස්ථා අහිමි වී තිබුණි. | සෑම වසරකම අපි පොත් සහ වාර සඟරාවල ඉදිරි වසරේ මුද්‍රණය සඳහා අත්තිකාරම් ගෙවන්නෙමු. මෙම අත්තිකාරම් කිසිදු ප්‍රමාදයකින් තොරව පියවීමට කටයුතු කර ඇත. | ප්‍රමාදයකින් තොරව පොත් සහ වාර සඟරා ලබා ගැනීමට නිසි විධිවිධාන යෙදිය යුතුය. |

#### 3.1.2 පර්යේෂණ සහ සංවර්ධන කටයුතු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලය මගින් පර්යේෂණ ප්‍රදාන රු. 6,085,466 ක් උපයෝජනය කිරීමෙන් පසුව පවා, පර්යේෂකයන් 15 දෙනෙකු සිය අවසන් වාර්තා සමාලෝචිත වර්ෂය අවසානය වන තෙක් ඉදිරිපත් කර නොතිබුණි. | පර්යේෂකයන් 19 දෙනෙකු මේ වන විට ඔවුන්ගේ අවසන් වාර්තා ඉදිරිපත් කර ඇති අතර, ප්‍රධාන වශයෙන්ම පවතින COVID-19 වසංගත තත්ත්වය වැනි විවිධ හේතූන් මත පර්යේෂකයන් 16 දෙනෙකු පර්යේෂණ දීර්ඝ කිරීම් ඉල්ලා ඇත. | නිශ්චිත පර්යේෂණ කාල සීමාව තුළ පර්යේෂකයන්ගෙන් අවසන් වාර්තා ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 ආර්ථික නොවන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලය මගින් 2015 සිට 2020 දක්වා කාලය තුළ සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ක්‍රීඩා විද්‍යා ඒකකයේ සේවකයන් හය දෙනෙකු සඳහා රු. 30,000,000 ක් ලබා දී ඇත. කෙසේ වෙතත්, 2015 වසරේ සිට මෙම ඒකකයේ කිසිදු අධ්‍යයන පාඨමාලාවක් පවත්වා නොතිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් 2021 ජනවාරි 7 වැනි දින පැවති කොමිෂන් සභා රැස්වීමේදී උපාධි වැඩසටහන ආරම්භ කිරීම සඳහා යාපනය විශ්වවිද්‍යාලයට අනුමැතිය ලබා දී ඇත. | විශ්වවිද්‍යාලයේ සම්පත් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) රු. 5,026,090 ක මුදලක් අපේක්ෂිත අරමුණු සඳහා යොදා නොගෙන වසර 10 කට වැඩි කාලයක් සීමා කරන ලද අරමුදල් ගිණුම යටතේ පැවතුනි. | පරිත්‍යාගශීලියා විසින් කිසිදු විශේෂ කාර්යයක් සඳහන් කර නොමැති වීම හේතුවෙන් රු. 5,026,090 ක් වූ මෙම අරමුදල තවමත් නිශ්චිත කාර්යයක් සඳහා උපයෝජනය කර නොමැත. කමිටුවෙන් උපදෙස් ලැබුණු විගස, ඒ අනුව මෙම අරමුදල උපයෝජනය කිරීමට කටයුතු කරන්නෙමු. | මෙම අරමුදල් තවදුරටත් ප්‍රමාද කිරීමකින් තොරව උපයෝජනය කිරීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (i)ශිෂ්‍යත්ව වැඩසටහන් සඳහා විදේශගත වූ අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් අනූ (90) දෙනෙකු සේවයට වාර්තා කර නොතිබුණි. කෙසේ වෙතත්, 1983 සිට 2020 දක්වා කාලය තුළ ඇප ගිවිසුම් කඩකිරීම හේතුවෙන් රු.62,343,767 ක් වන සමාහාර ඇප වටිනාකම අයකර ගැනීමට විශ්වවිද්‍යාලය විසින් ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පවතින තොරතුරු මත, අයකරගත යුතු ඇප මුදල රු. 2,351,823 ක් වන අතර 2018.12.31 දිනට විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ මුළු ශේෂය රු. 4,425,613 කි. මෙම කාර්ය මණ්ඩලය ඔවුන්ගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල (UPF) සඳහා හිමිකම් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක හිඟ මුදල් අයකර ගැනීමට පසු විපරම් ක්‍රියාමාර්ග ගනු ලැබේ. | වගකිවයුතු නිලධාරීන්ගෙන් ඇප අයකර ගැනීමට වහාම කටයුතු කළ යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) විශ්වවිද්‍යාලය මගින් යාපනය විශ්ව විද්‍යාලයේ සහ වවුනියාව මණ්ඩපයේ අනධ්‍යයන සහ අධ්‍යයන කාර්ය මණ්ඩලවල පුරප්පාඩු 666 ක් සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩල පුරප්පාඩු 27 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි. | දැනට පවතින සේවක සංඛ්‍යා පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කිරීමට විශ්වවිද්‍යාලය සියලු උත්සාහයන් ගෙන ඇත. කෙසේ වෙතත්, නැවත නැවතත් දැන්වීම් පළ කළද, අවශ්‍ය සුදුසුකම් සහිත අයදුම්පත් ලැබී නොමැති බැවින් මහාචාර්ය, සහාය මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / කථිකාචාර්ය යනාදී ප්‍රධාන අධ්‍යයන තනතුරු කිහිපයක් පිරවීම සඳහා තවමත් කටයුතු කරමින් පවතී. එවැනි තත්ත්වයක් තුළ, විශ්වවිද්‍යාලය විසින් අධ්‍යයන වැඩසටහන් බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා මෙම පුරප්පාඩු වී ඇති තනතුරු | පුරප්පාඩු නොපමාව පිරවීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | තාවකාලික කථිකාචාර්යවරුන්, තාවකාලික උපදේශකවරුන් සහ තාවකාලික ප්‍රදර්ශකයින් මගින් පිරවීමට කටයුතු කර ඇත. | |
| (ii) අනුමත නොකළ කාර්ය මණ්ඩල කාණ්ඩ සඳහා ඔවුන්ගේ පත්වීම් දිනයේ සිට වැටුප් සහ අනෙකුත් දීමනා ලෙස විශ්වවිද්‍යාලය විසින් රු. 1,225,604 ක් ගෙවා ඇත. තවද, අතිරික්ත සේවක සංඛ්‍යාව සඳහා අනුමැතිය ලබා ගැනීමට විශ්වවිද්‍යාලය නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉදිරියේ දී අනුමත සේවක සංඛ්‍යාව නොඉක්මවන බව සහතික කිරීමට පියවර ගනු ඇත. | අතිරික්ත සේවක සංඛ්‍යාව සඳහා අනුමැතිය ලබා ගැනීමට යෝග්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.5 නොවිසඳුණු විගණන ගැටළු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 සැප්තැම්බර් 18 දිනැති අංක 13/2015 දරන ආයතන චක්‍රලේඛයට සහ 2016 ජනවාරි 09 දිනැති අංක 13/2015 (i) දරන ආයතන චක්‍රලේඛයට පටහැනි වන පරිදි, 2015 වසරේ සිට 2018 දක්වා වැඩ බලන ලද සේවා කාලය සඳහා විශ්වවිද්‍යාලයේ වැඩබලන මූල්‍යාධිකාරිවරයාට රු. 1,740,000 ක වාහන දීමනාවක් සහ රු.710,360 ක ඉන්ධන දීමනාවක් ගෙවා තිබුණි. | වැඩ බලන මූල්‍යාධිකාරිවරයා 2013.12.21 සිට 2018.12.31 දක්වා කාලය තුළ සේවය කර ඇත. අංක 13/2015 දරන ආයතන චක්‍රලේඛයට අනුව වැඩ බලන මූල්‍යාධිකාරිවරයා ඉහත ගෙවීම සඳහා සුදුසුකම් ලබයි. 2009.02.20 දිනැති අංක 1589/30 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ කාර්ය පටිපාටික රීති 1 වන කාණ්ඩයේ IX පරිච්ඡේදයේ 119 වැනි ඡේදයේ විධිවිධානවලට අනුව, වැඩ බලන මූල්‍යාධිකාරිවරයා වෙත ප්‍රවාහණ සහ ඉන්ධන දීමනා ගෙවා ඇත. | අක්‍රමවත් ගෙවීම් වගකිවයුතු නිලධාරීන් ගෙන් අයකරගත යුතුයි. |